**රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදල - 2014**

---------------------------------------------------------------

රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, භාර ප්‍රාග්ධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීම් තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2005 අගෝස්තු 03 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම විගණනය සිදුකිරීම සඳහා මා විසින් ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබාගන්නා ලදි. මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවට අනුකූලව නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ විගණන ප්‍රමිත වලට (1SSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.

**1.4 මතය ව්‍යාචනය කිරීමේ පදනම**

------------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයෙන් උද්ගතවන බලපෑම පරිදි 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය පිළිබඳව සනාථ කර ගැනීමට මට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය ව්‍යාචනය**

------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයෙන් උද්ගතවන බලපෑමේ වැදගත්කම අනුව, මතයක් ප්‍රකාශ කිරීම සඳහා ප්‍රමාණාත්මක සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම සඳහා පදනමක් ලබාගැනීමට මාහට නොහැකි විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය වූ රු.484,776,813 ක මුදල සනාථ කර ගැනීමට මා හට නොහැකි විය. භාණ්ඩාගාරයෙන් නියමිත දිනය දක්වා ශේෂ සනාථන හෝ වෙනත් සාක්ෂි මගින් හෝ එම ශේෂය සනාථ කර ගැනීමට මා හට නොලැබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය

(අ) 2005 අගෝස්තු 03 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ (ඒ) ඡේදයෙහි 12 වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලය මාස 03 කට වරක්වත් රැස්විය යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් පවත්වා නොතිබුණි.

(ආ) 2006 ජුනි 27 දිනැති අවබෝධතා ගිවිසුමේ (MOU) විෂය අංක 06 ප්‍රකාරව, අරමුදලට දායකවන එක් එක් සහභාගීත්ව රාජ්‍ය ආයතනවලින්, අවම වශයෙන් මාස 06 කට වරක් ඔවුන්ගේ පුරෝකථනය කළ අරමුදල් ප්‍රවාහ විස්තර භාර කළමනාකරුට ඉදිරිපත් කරන ලෙස භාරකරුවන් ඉල්ලා සිටිය යුතුයි. එසේ වුවත්, මෙවැනි පුරෝකථනය කරන ලද අරමුදලේ ප්‍රවාහ විස්තර සමාලෝචිත වර්ෂය තුලදී භාර කළමනාකරුට ලැබී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

--------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය ලාභාංශවලට පෙර රු.මිලියන 95.95 ක ශුද්ධ ආදායමක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභාංශවලට පෙර ශුද්ධ ආදායම රු.මිලියන 110.01 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 14.06 ක් හෙවත් සියයට 12.78 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ආයෝජන අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස පොලී ආදායම අඩුවී තිබීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත කාලපරිච්ඡේදය තුල භාරයේ එක් රාජ්‍ය ආයතනයක් පමණක් රු.මිලියන 59.56 ක් අරමුදල් තැන්පත් කර තිබුණද, වර්ෂය තුලදී අරමුදලෙන් ආපසු ගැනීම් රු.මිලියන 204.88 ක් විය. එම නිසා, මෙම තත්ත්වය අරමුදලේ ලාභදායීත්වයට හා අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය ආයෝජන මත පොලිය වේ. එසේ වුවත්, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ආයෝජන රු.මිලියන 78.36 කින් අඩු වී තිබුණි.

(ඈ) ආයෝජිකයින් වෙනුවෙන් වෙනම ලිපිගොනු හා ලෙජර පිටු පවත්වා ගෙන යෑම.

(i) අරමුදලේ ආයෝජකයින් සංඛ්‍යාව 18 ක් වුවද, නියමිත ලියකියවිලි සහිත වෙනම ලිපිගොනු එක් එක් ආයෝජකයන් වෙනුවෙන් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන නොපමාව සකස් කිරීම සඳහා ආධාරවන අවශ්‍ය ගිණුම් සඳහා නියමිත ලෙජර පවත්වා ගෙන ගොස් නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.** **පද්ධති හා පාලනයන්**

**------------------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| ලෙජර ගිණුම් | භාර අරමුදල විසින් නියමිත ලෙජර පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| ආයෝජක ලිපිලේඛන | ආයෝජකයින් වෙනුවෙන් සියලුම අදාල ලියකියවිලි සහිත වෙනම ලිපිගොනු පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| ආපසු ගැනීම් | තැන්පතුවලින් ආපසු ගැනීමේ ප්‍රතිභතය සියයට 344 ලෙස වාර්තා වී තිබුණි. |
| භාර ඔප්පුව සමඟ අනුකූල නොවීම | 2014 වර්ෂය තුල භාර අරමුදල් මණ්ඩලය විසින් රැස්වීම් පවත්වා නොතිබුණි. |